**GMOA** ESTABLISHED IN 1926 TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/01/23

# මාධ්‍ය නිවේදනයයි

**වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංශෝධනයක් නිලධාරී වාදයේ ගොදුරක් නොවිය යුතුය.**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට වෛද්‍යවරුන් බඳවා ගැනීමේ, උසස්වීම් ලබාදීමේ හා විශ්‍රාම ගැන්වීමේ සම්මත ක්‍රියා පටිපාටිය වෛද්‍ය සේවා ව්‍යවස්ථාවයි. දැනට ක්‍රියාත්මක වන්නේ 1991 දි සම්මත කළ සේවා ව්‍යවස්ථාවයි.

රාජ්‍ය පරිපාලන අංශයේ 2006/06 චක්‍රලේඛන මඟින් සියලු සේවා ව්‍යවස්ථාවන් යථාවත් කළයුතු ආකෘතිය දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කරන ලෙස අදාල සියලුම අමාත්‍යංශ වෙත දන්වා ඇත.

සෞඛ්‍ය අමාත්‍යංශය විසින් 2011 වසර වන විටත් වෛද්‍ය සේවා ව්‍යවස්ථාව යථාවත් කර තිබුනේ නැත.

2010 වසරේදි රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය මුල්වී සියලු දෙනා නියෝජනයවූ කමිටුවක් යොජනා ලබාගෙන 2006/06 චක්‍ර ලේඛයට අනුව සකස් කරන ලද යොජනාවන් සෞඛ්‍ය අමාත්‍යංශය වෙත ඉදිරිපත් කළේය.

මෙම යෝජනාවන් සඳහා සෞඛ්‍ය අමාත්‍යංශයේද, වැටුප් සේවක සංඛ්‍යා කොමිසමේද, මුදල් අමාත්‍යංශයේද, කළමනාකරන කොමිසමේ හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේද අනුමැතිය ලැබුණි. මෙම යෝජනා රාජ්‍ය සේවා කොමිසමට ඉදිරිපත් කළේ මීට වසරකට පෙරදිය.

රාජ්‍ය සේවා කොමිසම අවස්ථා ගණනාවකදි පැහැදිලි කිරීම් ඉල්ලා සිටි අතර එක් අවස්ථාවකදි ආකෘතිය වෙනස් කර ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අතර එය සම්පූර්ණ කර යවා බොහෝ කල් ඉකුත්ව ගොස් ඇත. ඉන් පසුව කරුණු 33 ක් සම්බන්ධව පැහැදිලි කිරීම් ඉල්ලා එවූ අතර ඒවාට අදාල පැහැදිලි කිරීම් ද ලබා දි සාමාන්‍ය ආකාරයට හා පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇති වෛද්‍යවරුන් සඳහා සුවිශේෂ ආකාරයට උසස්වීම් ලබා ගත හැකි පරිදි සකස් කල පැහැදිලි කිරීම් ලබා දුනි. තවද සියලුම සමාන්තර ශ්‍රේණි සඳහා ලබා දෙන උසස්වීම් පටිපාටිය හා විධිවිධාන වෛද්‍යවරුන් සඳහාද ලබා දෙන ලෙස පැහැදිලිව ඉල්ලා ඇත.

2012 වසරේදි නිකුත් කල විශේෂ චක්‍ර ලේඛයක් මගින් 2012/12/31 වන විට සියලුම රාජ්‍ය සේවකයන්ගේ ව්‍යවස්ථා සංග්‍රහ සම්පූර්ණ කර අවසන් කල යුතු බව නියෝග කෙරිණි. මේ සම්බන්ධ වැඩි දුරටත් උපදෙස් දෙන රජය මේ සඳහා වෙනමම කාර්ය මණ්ඩලයක් යොදවන ලෙසත් මේ සඳහා ගෙවීම් ලබා දෙන ලෙසත් තදින් දැනුම් දි තිබිණි.

තවද, 2012 අය වැය යෝජනා සම්බන්ධව සියලු වෘත්තිය සමිති නියෝජිතයින් සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදි රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 06/2006 හි දැක්වෙන ආකාරයට සියලුම ව්‍යවස්ථා සංග්‍රහ සකස් නොකිරීම් පිලිබඳව එතුමා දැඩි කනස්සල්ල පල කල අතර, රාජ්‍ය සේවාවේ සමහර අංශ වල ආකාර්යක්ෂමතාවය මෙයට වගකිව යුතු බව පෙන්වා දුනි.

එනමුත් තවමත් වෛද්‍ය සේවා ව්‍යවස්ථාව අනුමත වී නැති බැවින් පසුගිය නොවැම්බර් මස 04 වන දින වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට යෝජනා කල මුත් මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී ජයසුන්දර මහතා මගින් අතිගරු ජනාධිපතිතුමා එවූ පණිවිඩය අනුව වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය කල් දැමුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාල පාර්ශව සමග සාකච්ඡා කර මෙම යෝජනා සම්මත කර ගැනීම සඳහා කල් ලබා දීම සඳහාය.

මේ අනුව වෛද්‍ය සේවා ව්‍යවස්ථාව තවමත් සම්මත කර අවසන්ව නොතිබීම අතිගරු ජනාධිපතිතුමා 2012 වසරේදී නිකුත් කල උපදෙස් නොසලකා හැරීමකි.

රාජ්‍ය සේවා කොමිසම මේ වන විට,

1. සෞඛ්‍ය අමාත්‍යාංශය
2. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම
3. මුදල් අමාත්‍යාංශයේ කළමණාකරණ කොමිසම
4. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය

යෝජිත වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට ලබා දුන් නිර්දේශ නොසලකා හැර ඇත.

මේ වනතුරුත් අදාල අංශ වලින් ධනාත්මක ප්‍රතිචාරයක් නොමැතිවීම හේතුවෙන් මෙම මස 30 වන දින (2014/01/30) වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට එළඹීමට ඊයේ දින (2014/01/22) රැස්වූ හදිසි විධායක කමිටු රැස්වීමේදී තිරණය විය.

තවද, රෝගී සත්කාර බිඳ වැටීමේ හා රෝගී ජීවිත අවධානමට ලක් වීමේ සියලු වගකීම් අදාල අංශ විසින් භාරගත යුතු බවට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අවධාරණය කර සිටී.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර සඳහා - | වෛද්‍ය නවීන් සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය නලින් ආරියරත්න | - | 0714800942 |
| | වෛද්‍ය නාත් විජේසූරිය | - | 0714428322 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - | 0717876516 |